# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2397/11 - 2024 අගෝස්තු මස 12 වැනි සඳුදා - 2024.08.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* BD/ HD/LND/3/1/ඒ. එම්. ජයතිස්ස.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 4-3/7/2017/ HW/198.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන *ඉඩමේ / පරවශතාවේ විස්තර:*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දපල්ල කෝරලේ සුළු කොට්ඨාසයේ, මරංගහවෙල (158F) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මරංගහවෙල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද, අංක ක.සි. 710574 හි කලාප අංක 02, පත්‍ර අංක 1 හා 2024.04.08 වැනි දින දරන කැඩැස්තර සිතියම් කැබලි අංක 01, වශයෙන් සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0996 පමණ වූ ඉඩම්වල විස්තර පහත දැක්වේ:

01. **කැබලි අංක 1**

ඉඩමේ නම: ගඩොල්වලහේන; ඉඩමේ විස්තරය: වත්ත, අවු. 25-30 ක් පමණ වයසැති මිශ්‍ර වගාවක් සහ ළිඳක් ඇත; හිමිකම් කියන අය: මරංගහවෙල, ඌවතැන්න පදිංචිව සිට නැසීගිය අත්තනායක මොහොට්ටාලලාගේ ජයතිස්ස මයා, දැනට ඔහුගේ බිරිඳ වන මරංගහවෙල, ඌවතැන්න ලිපිනයේ පදිංචි කොඩිතුවක්කු ආරච්චිලාගේ මේබල් මිය; ප්‍රමාණය: හෙක්: 0.0996 (පර්චස් 39.4)

මායිම් :

උතුරට : අ.ග.පි. 286 හි කැබලි අංක 37; නැගෙනහිරට : අ.ග.පි. 286 හි කැබලි අංක 37 සහ 289; දකුණට : අ.ග.පි. 286 හි කැබලි අංක 289 සහ 37; බටහිරට: අ.ග.පි. 286 හි කැබලි අංක 37.

අරමුණ - කොළඹ සිට මඩකලපුව මාර්ගයේ 168/10 - 168/11 බෝක්කුව අතර නාය යන ස්ථානයේ නායයෑම පාලනයට අදාළ නිර්මිතයන් ඉදිකිරීමට අත්කර ගැනීම සඳහා.

ඉහත සඳහන් *ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්

1A - G 042456 – 19 (2024/08)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2024 ඔක්තෝබර් මස 23 වැනි දින පෙ.ව. 10.00** ට හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, **2024 ඔක්තෝබර් මස 16** වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී *ඉඩම/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**කේ. ඒ. ජේ. ප්‍රියංගිකා,**
ප්‍රාදේශීය ලේකම්,
හල්දුම්මුල්ල.

2024 අගෝස්තු මස 05 වැනි දින,
හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08-0150

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.